අහෝ ජනයිනි, කවරෙකු යමක් ගැන දන්නේද එය පවසා සිටිත්වා. කවරෙකු නොදන්නේද ඔහු අල්ලාහු අඃලම් (මැනවින් දන්නා අල්ලාහ් වේ) යැයි පවසා සිටිත්වා. තමන් නොදන්නා දෑට මැනවින් දන්නා අල්ලාහ් වේ යැයි පවසා සිටීම දැනුම අතුරින් වූවකි.

මස්රූක් තුමා විසින් වාර්තා කරන ලදී. අපි අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් -රළියල්ලාහු අන්හු- තුමා වෙතට පිවිසුනෙමු. එවිට එතුමා: "අහෝ ජනයිනි, කවරෙකු යමක් ගැන දන්නේද එය පවසා සිටිත්වා. කවරෙකු නොදන්නේද ඔහු අල්ලාහු අඃලම් (මැනවින් දන්නා අල්ලාහ් වේ)
යැයි පවසා සිටිත්වා. තමන් නොදන්නා දෑට මැනවින් දන්නා අල්ලාහ් වේ යැයි පවසා සිටීම දැනුම අතුරින් වූවකි. උත්තරීතර අල්ලාහ් තම නබිවරයාට මෙසේ පවසා සිටියි. "ඒ වෙනුවෙන් කිසිදු කුලියක් මම ඔබලාගෙන් නොඉල්ලමි. තවද මම ස්ව කැමැත්ත පරිදි ප්රකාශ කරන්නන් අතුරින් ද නොවෙමි යැයි (නබිවරය,) ඔබ පවසනු." (38:86) [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

හදීසයේ තේරුම: සැබැවින්ම මිනිසා තමන් දන්නා යම් කිසිවක් ගැන විමසනු ලැබූ විට, එය නොසඟවා ජනයාට පැහැදිලි කළ යුතුය. තමන් නොදන්නා දෑ ගැන විමසනු ලැබූ විට ඔහු අල්ලාහු අඃලම් (මැනවින් දන්නා අල්ලාහ්ය) යැයි පැවසිය යුතු අතර පිළිතුරු දීමට උත්සහ දැරිය යුතු නොවේ. තමන් නොදන්නා දෑට මැනවින් දන්නා අල්ලාහ් යැයි පැවසීම දැනුමෙන් වූවකි. එනම්: මිනිසා නොදන්නා දෑට අල්ලාහු අඃලම් යැයි පැවසීම දැනුම සංකේතවත් කරන්නකි. හේතුව ඔහු නොදැන සිටියදී තමන් නොදන්නා බව පවැසීම සැබැවින්ම එහි ප්රමාණය එහි තත්ත්වය ගැන සැබෑ ලෙසින්ම දන්නා වන බැවිනි. නමුත් ඒ ගැන ඔහුට අවබෝධයක් නොමැති බැවින් මැනවින් දන්නා අල්ලාහ් යැයි නොදන්නා දෑට පවසයි. මුස්ලිම්හි සඳහන් ප්රකාශයක සැබැවින්ම ඔබ අතුරින් මැනවින් දන්නා තමන් නොදන්නා දෑට මැනවින් දන්නා අල්ලාහ් යැයි පැවසීමය. ඉබ්නු මස්ඌද් තුමා එයට සාධක වශයෙන් "ඒ වෙනුවෙන් කිසිදු කුලියක් මම ඔබලාගෙන් නොඉල්ලමි. තවද මම ස්ව කැමැත්ත පරිදි ප්රකාශ කරන්නන් අතුරින් ද නොවෙමි යැයි (නබිවරය,) ඔබ පවසනු." (38:86) යන උත්තරීතර අල්ලාහ්ගේ ප්රකාශය දන්වා සිටියේය. එනම් දේව පණිවිඩ තුළින් මා ගෙන ආ දෑ සඳහා මා වෙත කුලී ලබා දෙන මෙන් මම ඔබගෙන් නොඉල්ලමි. මම ඔබට දැනුම් දෙනුයේ යහපතය. තවද මම අල්ලාහ් වෙත ඔබව ඇරයුම් කරමි. මම ස්ව කැමැත්ත පරිදි ප්රකාශ කරන්නන්ගෙන් කෙනෙකු නොවෙමි. යනු මා ඔබව අපහසුතාවට පත් කරන්නන්න් අතුරින් හා දැනුමෙන් තොරව යමක් පවසන්නන් අතුරින් කෙනෙකු නොවන බවයි. මින් ලැබෙන සාධකය වනුයේ: තීන්දු තීරන දෙන්නට හැකියාව ඇතොත් මිස ආගමික තීන්දු දීම මිනිසාට සුදුසු නොවන බවය. ජනයා මෙහෙයවන ඉමාම් වරයකු බවට පත්වනු අල්ලාහ් අභිමත කළේ නම් ඔහු ඔවුනට තීන්දු දෙනු ඇත. ඔවුන් නිවරැදි මාර්ගය වෙත මඟ පෙන්වනු ඇත. එවිට එය යහපතක් බවට වනු ඇත. අල්ලාහ් එය අභිමත නොකළේ නම්, එම තීන්දුව ක්රියාත්මක කිරීමෙහි ඔහුට ඵලක් ගෙන දෙන්නේ නැත. එය ඔහු මෙලොවෙහි හා මතුලොවෙහි විනාශය ගෙන දෙන්නක් බවට පත් වනු ඇත. මතාලිඋල් අන්වාර් අලා සිහාහුල් ආසාර් (4/439), රියාලුස් සාලිහීන් හි විග්රහය: ඉමාම් උසය්මීන් (6/391, 392)

